


# මෙම සමාගමේ කොළඹ ජාත්‍යන්තර ගුවන්තොටුපොළ රත්මලාන පවතින පහත සඳහන් තනතුරෙහි පුරප්පාඩු පිරවීම සඳහා සුදුසුකම් ලත් පුද්ගලයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## කාර්මික ශිල්පී (ඩීසල් වැද්දුම්) 11වන ශ්‍රේණිය

**රැකියාවේ ස්වභාවය :** සහකාර ඉංජිනේරු හා තාක්ෂණ නිළධාරීන් යටතේ සියළු විදුලි උත්පාදක යන්ත්‍ර හා ඒ හා සම්බන්ධ අදාල යාන්ත්‍රික උපකරණවල සේවා හා නඩත්තු කටයුතු සිදු කිරීම.

**රැකියාවේ වගකීම් :**

1 සියළු විදුල උත්පාදක යන්ත්‍ර, ඒ හා සම්බන්ධිත පද්ධති හා අදාල යාන්ත්‍රික උපකරණ ආශ්‍රිත හදිසි ක්‍රියා විරහිත වීම් හා, බිඳ වැටීම් යථා තත්ත්වයට පත් කිරීමට කටයුතු කිරීම.

11 අවශ්‍ය වු විටක ඉහත ක්ෂේත්‍ර වපසරියේ සවි කිරීම් හෝ නවීකරණ කටයුතු කිරීම.

111 කටුනායක, මත්තල, සහ පිදුරුතලාගල පිහිටුවා ඇති විදුලි උත්පාදක යන්ත්‍ර වල සේවා කටයුතු හා අළුත් වැඩියා කටයුතු සිදු කිරීම.

1V විදුලි උත්පාදක යන්ත්‍ර, ඒ හා සම්බන්ධ අදාළ යාන්ත්‍රික උපකරණ වලට අදාලව ක්‍රියාකරවීම් හා නඩත්තු කටයුතු සඳහා දත්ත වාර්තා පවත්වා ගෙන යාම.

V ඉහල නිළධාරීන් විසින් සපයා දෙනු ලබන ගුවන් තොටුපොළ පරිශ්‍රය තුල ඇති විදුලි උත්පාදක යන්ත්‍ර ක්‍රියාකාරීත්වය හා සම්බන්ධ කාර්යය සටහන් යාවත්කාලීන කරමින් දෛනික පරීක්ෂාවේ යෙදවීම.

VI දත්ත වාර්තා රැස් කිරීමෙන් හා නිරීක්ෂණ කටයුතු තුලින් ඉහල නිළධාරීන්ගේ පරීක්ෂණ කටයුතු සඳහා සහාය වීම.

VII විදුලි උත්පාදක යන්ත්‍ර උපකරණ හා ඒ අවට පරිසරය සතුටුදායක අයුරින් පවත්වා ගෙන යාම.

VIII ගුවන් තොටුපොල නඩත්තු කටයුතු ක්‍රියාවලිය හා සම්බන්ධ ගැටළු අවස්ථාවන්හිදී සක්‍රිය ලෙස ඒ සඳහා දායක වීම.

IX අවශ්‍ය අමතර කොටස් අවශ්‍ය උපකරණ හා අයිතමයන් ලැයිස්තු පිළියෙල කිරීමට සහාය දැක්වීම.

X ඉහත සියළුම පද්ධතීන් පූර්ව නිරීක්ෂණය කර පූර්ව දෝෂ හඳුනා ගැනීම හා වාර්ථා කිරීම.

**සුදුසුකම් :** (අ) ජාතික ආධුනිකත්ව මණ්ඩලයෙන්/ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරියෙන් නිකුත් කරනු ලැබූ ඩීසල් වැද්දුම් ක්ෂේත්‍රයේ දැවුරුද්දකට (02)නොඅඩු පූර්ණ කාලීන පාඨමාලා සහතිකයක් හෝ දැවුරුද්දකට (02) නොඅඩු පූර්ණ කාලීන පාඨමාලාවක් හැදෑරීමෙන් අනතුරුව කාර්මික විද්‍යාලයක් මගින් නිකුත් කරනු ලැබූ වෘත්තය ආධුනිකත්ව සහතිකයක් අදාළ ක්ෂේත්‍රයෙන් ලබා තිබීම.

**හෝ**

(ආ) ජාතික වෘත්තිය සුදුසුකම් 4 වන මට්ටම (NVQ Level 4) වෘත්තිය සහතිකයක් අදාළ ක්ෂේත්‍රයෙන් ලබා තිබීම.

**සහ**

(ආ) ආධුනිකත්ව කාලසීමාවද/පාඨමාලා කාල සීමාවද ඇතුලත්ව සිව් (04) වසරක පළපුරුද්දක් අදාළ ක්ෂේත්‍රයෙන් ලබා තිබිම.

**වයස :** අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය වන විට අවුරුදු 35ට නොවැඩි විය යුතුය.

**වැටුප :** තෝරාගනු ලබන්නන් හට සියළු දීමනා සහිත ආකර්ෂණීය වැටුපක් හා ප්‍රතිලාභ රැසක් හිමිවේ.

**තෝරා ගැනිමේ ක්‍රමය :** ප්‍රායෝගික පරීක්ෂණයක් සහ සම්මුඛ පරීක්ෂණයක් මගින්

**පොදු කරුණු :-**

ඉහත තනතුර සඳහා තෝරාගනු ලබන අයදුම්කරුවන් සමාගමට අයත් දිවයිනේ පිහිටි ඕනෑම ස්ථානයක සේවය කල යුතු වේ.

ඉහත සුදුසුකම් හා සේවා පළපුරුද්ද ලබා තිබේ නම් මෙම වෙබ් අඩවියේ ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුව සකස් කල අයදුම්පතයක් පහත සඳහන් ලිපිනයට 2025 **ඔක්තෝබර් මස 27 වන දිනට** පෙර ලැබෙන සේ **ලියාපදිංචි තැපෑලෙන් හෝ කුරියර් සේවා මගින් පමණක්** ඉදිරිපත් කළ යුතුවේ. අයදුම්පත් බහාලන කවරයේ **ඉහළ වම් කෙළවරේ** අයදුම්කරන **තනතුර** සඳහන් කළ යුතුවේ.

**සුදුසුකම් සනාථ කිරීමට අදාල සහතික වල ජායා පිටපත් සමඟ ඉදිරිපත් නොකරන අයදුම්පත් හෝ අපගේ වෙබ් අඩවියේ ඇති ආදර්ශ අයදුම්පත අනුව ඉදිරිපත් නොකරන අයදුම්පත් හෝ අනුමත මාධ්‍ය වලින් හැර වෙනත් මාධ්‍යයන්ගෙන් ඉදිරිපත් කරන අයදුම්පත් සහ අයදුම්පත් භාර ගැනිමේ අවසන් දිනෙන් පසුව මෙම කාර්යාලය වෙත ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.**

**තෝරා ගැනිමේ ක්‍රියාවලියේ සෑම අදියරකදීම සුදුසුකම්ලත් අයදුම්කරුවන්ට පමණක් දැනුම් දෙනු ලැබේ.**

**සභාපති**
**ගුවන් තොටුපොල හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම**
**බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොල**
**කටුනායක**

Adver. :05/10/2025